සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගය - 2021


## (01) භාෂා කුසලතාව

පැ. තුනයි

### විභාග අපේක්ෂකයන්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ.

**0 1 2 3 4 5 6 7 8 9**

ඔබේ විභාග අංකය මෙහි ද තුන් වන හා පස් වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.

....................................

විභාග අංකය නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **11**කින් හා ප්‍රශ්න **38** කින් යුක්ත වේ.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනි ව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.

✳ **ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.**

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායාරූප හෝ ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ **අපැහැදිලි ඉලක්කම් සහිත, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත් ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 10 | |
| 3 | 11 - 20 | |
| 4 | 21 - 30 | |
| 5 | 31 - 35 | |
| 5 - 7 | 36 | |
| 8 - 9 | 37 | |
| 9 - 11 | 38 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | | |
|---|---|---|
| උත්තර පත්‍රය | ලකුණු කළේ | |
| | පරීක්ෂා කළේ | |
| | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

● අංක **1** සිට **3** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වචන අතුරින් එක් වචනයක පමණක් අක්ෂර වින්‍යාසය වැරදි ය. එම වචනය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න. *(ලකුණු 03 යි)*

1. (1) අකර්මණ්‍ය (2) අෂ්ටාංගික
   (3) චතුරස්‍ර (4) චන්දෝලංකාර (………)

2. (1) අමාත්‍යාංශය (2) ථූපවංශය
   (3) විශ්වසනීය (4) දෘශ්‍යකාව්‍ය (………)

3. (1) නිරුපද්‍රැත (2) සනාතන
   (3) පෘථක්ජන (4) විස්මය (………)

● අංක **4** සිට **6** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වචන අකාරාදි පිළිවෙළට සකස් කළ විට නිවැරදි ව දැක්වෙන අනුපිළිවෙළ තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න. *(ලකුණු 03 යි)*

4. අ. අධ්‍යාශය ආ. අත්‍යුත්තම **ඉ.** අණ්ඩජ ඊ. අභිචාර
   (1) අ, ආ, **ඉ**, ඊ (2) **ඉ**, ආ, අ, ඊ
   (3) **ඉ**, ඊ, ආ, අ (4) ආ, **ඉ**, අ, ඊ (………)

5. අ. ඉන්ධන ආ. ඉන්ද්‍රකීලය **ඉ.** ඉෂ්ටාර්ථය ඊ. ඉච්ඡා
   (1) ඊ, ආ, අ, **ඉ** (2) අ, ආ, ඊ, **ඉ**
   (3) **ඉ**, ඊ, අ, ආ (4) අ, **ඉ**, ආ, ඊ (………)

6. අ. භාර්යා ආ. භාණ්ඩාගාර
   **ඉ.** භෛෂජ්‍ය ඊ. භෘංග
   (1) ආ, ඊ, **ඉ**, අ (2) අ, ඊ, ආ, **ඉ**
   (3) ආ, අ, ඊ, **ඉ** (4) ඊ, ආ, අ, **ඉ** (………)

● අංක **7** සිට **9** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වචන හතර අතුරින් නිවැරදි ව විසන්ධි කර **නොමැති** වචනය තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න. *(ලකුණු 03 යි)*

7. (1) අරුණෝදය (අරුණ + උදය) (2) ජලාපවහන (ජල + අපවහන)
   (3) නෙතග (නෙත + අග) (4) ගංතෙර (ගඟ + තෙර) (………)

8. (1) තුනුවග (තුනු + වග) (2) දෝත (දොහො + අත)
   (3) බිලියම් (බිලි + කම්) (4) පන්තිස් (පස් + තිස්) (………)

9. (1) පුස්තකාලය (පුස්තක + ආලය) (2) ජගදානන්ද (ජගත් + ආනන්ද)
   (3) සච්චාරිත්‍ර (සච් + චාරිත්‍ර) (4) ශල්‍යාගාර (ශල්‍ය + අගාර) (………)

● අංක **10** ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න. *(ලකුණු 01 යි)*

10. අකුරු ගළපන ලද කල්හි අර්ථවත් වචනයක් සෑදෙන පිළිතුර කුමක් ද?
   (1) ප්‍රශ්නයෝදිජ (2) තින්නියවේද
   (3) කාළිකාශ්වාත (4) ලසිබයරස්ක (………)

[ 3 වන පිටුව බලන්න.

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වාක්‍ය සදොස් වේ නම්, **නිදොස් කොට සම්පූර්ණ වාක්‍යය ම තිත් ඉර මත** නැවත ලියන්න. නිදොස් වේ නම්, '**නිවැරදි යි**' **යන්න පමණක්** ලියන්න. *(ලකුණු 05 යි)*

11. අපේ දරුවන් රටේ අනාගත පුරවැසියෝ ය.

.........................................................................................................

.........................................................................................................

12. දැඩි නියඟය නිසා ගංගාවන් වියළී ගොස් තිබේ.

.........................................................................................................

.........................................................................................................

13. අමාවතුර ලියූවේ ගුරුළුගෝමීහු ය.

.........................................................................................................

.........................................................................................................

14. හොරුන්ගෙන් එක් අයෙක් පොලීසියට බාර වූ අතර අනෙකා පැන දිව්වේ ය.

.........................................................................................................

.........................................................................................................

15. පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයට පැමිණි අමුත්තන් විදුහල්පතිතුමා විසින් පිළිගනු ලැබූහ.

.........................................................................................................

.........................................................................................................

15. වැව අසල වනයෙහි බොහෝ පක්ෂීහු ඇතත් සිවුපාවුන් නැත.

.........................................................................................................

.........................................................................................................

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද අතුරින් **නොගැළපෙන** පදය තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 05 යි)*

16. (1) මකුට (2) කෙස්
(3) වරලස (4) මුහුල (.........)

17. (1) අනභිභවනීය (2) අනුල්ලංඝනීය
(3) අනුත්තරණීය (4) අනතික්‍රමණීය (.........)

18. (1) කලහ (2) කැරලි
(3) අරගල (4) වියවුල (.........)

19. (1) සිනිඳු (2) මොළොක්
(3) කෝමල (4) ළපටි (.........)

20. (1) ජන්මය (2) කුලය
(3) වරිගය (4) වංශය (.........)

[ 4 වන පිටුව බලන්න.

- අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ මුලින් දී ඇති **තද කළු අකුරින් මුද්‍රිත** පදයට සමානාර්ථයක් **නොදෙන** පදය තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න. *(ලකුණු 05 යි)*

21. **ප්‍රසිද්ධ**
   (1) පතළ (2) ප්‍රවතර
   (3) වැදගත් (4) පරසිඳු (.........)

22. **සමය**
   (1) කාලය (2) මොහොත
   (3) යුගය (4) වකවානුව (.........)

23. **අනර්ථවත්**
   (1) අහිතවත් (2) හානිකර
   (3) අවැඩදායී (4) අර්ථශූන්‍ය (.........)

24. **ළඳ**
   (1) කාන්තාව (2) ලබ්ධිය
   (3) තරුණි (4) විලඳ (.........)

25. **නොදුටු**
   (1) අසම්මුඛ (2) අසදෘශ
   (3) ආගන්තුක (4) අදෘෂ්ට (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති එක් එක් වාක්‍යාංශයෙහි නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ අර්ථය දෙන වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න. *(ලකුණු 05 යි)*

26. කෙළවරක් දැකීමට නොහැකි
   (1) අපරියන්ත (2) අපරිමිත
   (3) අනවරාග්‍ර (4) අසීමිත (.........)

27. කෙනෙකු තුළ පවත්නා නොමනා පැවතුම් හා හැසිරීම්වල ස්වභාවය
   (1) අශෝභන (2) අපවිත්‍ර
   (3) දුරාචාර (4) සාවද්‍ය (.........)

28. භාරකාරයෙකු සතුව පවත්නා යමක් බලහත්කාරයෙන් ගැනීම
   (1) අපහරණය (2) සංහාරය
   (3) අදත්තාදානය (4) පරිහරණය (.........)

29. තැනට ගැළපෙනසුලු
   (1) කාලෝචිත (2) අවස්ථෝචිත
   (3) සමයෝචිත (4) ස්ථානෝචිත (.........)

30. අමතක වූ දෙයක් යළි සිහියට නැංවීම
   (1) සම්මර්ශන (2) ආවර්ජන
   (3) ස්මරණ (4) පරිවහන (.........)

[ 5 වන පිටුව බලන්න.

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ මුලින් දී ඇති **තද කළු අකුරින් මුද්‍රිත** යෙදුමට සමාන තේරුම් දෙන වාක්‍යාංශය හෝ පදය හෝ තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

*(ලකුණු 10 යි)*

31. **අනේ කාලේ වනේ වාසේ**
    (1) නරක කාලයෙහි වනගත වීම
    (2) බොහෝ කාලයක් වනයේ ජීවත් වීම
    (3) නරක කාලයෙහි නෑයන්ගෙන් ඈත්ව විසීම
    (4) වනගත වී තපස් රැකීම (.........)

32. **අලේට වඩා වැල ලොකු වීම**
    (1) යහපත ඉක්මවා අයහපත පැතිර යාම
    (2) වැල දික්වන විට අලයට වඩා ලොකු වීම
    (3) ධනය නිසා මිතුරන් අමතක කිරීම
    (4) විවාහයෙන් පසු දෙමවුපියන්ට නොසැලකීම (.........)

33. **අං හරස් කිරීම**
    (1) අරගලයකට සූදානම් වීම
    (2) යාතුකර්ම විශේෂයකි
    (3) කෙනෙකුට බාධා කිරීම
    (4) සිංහල-දෙමළ අවුරුදු උත්සවයට අදාළ ක්‍රීඩාවකි (.........)

34. **ඇඳිරියට කනා මැදිරියන් පත්තු කිරීම**
    (1) අඳුර යන්තමින් හෝ පළවා හැරීම
    (2) මෝඩ ක්‍රියාවක යෙදීම
    (3) ආලෝකය ලබා ගැනීමේ උපක්‍රමයකි
    (4) අභව්‍ය සිදුවීමකි (.........)

35. **කන්දක් විළි ලා මී පැටවකු වැදීම**
    (1) බොහෝ වෙහෙසී දරුවකු ප්‍රසූත කිරීම
    (2) කන්දක් සිදුරු කර මීයෙකු රිංගීම
    (3) මහන්සියෙන් කළ වගාව මීයෙකු විනාශ කිරීම
    (4) ඇඩි මහන්සියකින් සුළු ඵලයක් ලැබීම (.........)

36. පහත සඳහන් පාඨය හොඳින් කියවා, ඒ ඇසුරින් දී ඇති එක් එක් ප්‍රකාශය
    **නිවැරදි** නම් අංක **1** ද
    වැරදි නම් අංක **2** ද
    **අවිනිශ්චිත** නම් අංක **3** ද පමණක්
    ඒ ඒ ප්‍රකාශය ඉදිරියේ වරහන් තුළ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 01 ×20 =20යි)*

භාරතීයයන් ගැන කියන මැගස්තිනීස් ඔවුන් ඉතා නීතිගරුක යැයි ද එහි අපරාධ ඉතා අඩු යැයි ද සඳහන් කරයි. පාහියන් හා මධ්‍යතන සමයෙහි පැමිණි අරාබි දේශ සංචාරකයන් විසින් ද ඊට සමාන සාක්ෂ්‍ය දී ඇත. එසේ ද වුවත් හියු එං සාං මීට වෙනස් වූත් අඩුතර අනුකූලතාවකින් යුක්ත වූත් සටහනක් දී ඇත. ඉන්දියානු ග්‍රන්ථකාරයන් විසින් දේශසංචාරකයන් දී ඇති සටහන් එසේ ම යැයි එහැම පිටින් ම ස්ථිර කොට නැත. කෙසේ හෝ ජීවිතය හා දේපළ සම්බන්ධ ආරක්ෂා රහිත බවෙන් ඇති වන ගැඹුරු හැඟීම්වලින් නීති සාහිත්‍යයේ පදනම තැනී ඇත.

මෞර්ය කාලය වැනි මුල් අවදියේ පවා ගම් බොහෝ විට අධික ජනගහනයෙන් පිරී පැවැත්තේ ය. පිටිසර පෙදෙස්හි හා කඳුකරයෙහිත් එදා සිටි බොහෝ දුප්පත් ජනයා අද මිනිසුන් කරන්නාක් මෙන් නගරවලට පැන ගත්හ. එහි ජීවිකාව ඔවුන්ගේ පැරණි පරිසරයේ යටතටත් වඩා දුෂ්කර බව ඔවුහු දුටුවෝ ය. මේ අභාග්‍ය සම්පන්න වූ ද උන් හිටි තැන් නැතිව ගියා වූ ද ජනයාගෙන් සමහරෙක් හැම පුරාණ ඉන්දියානු නගරවල ම ගැවසුණු අපරාධවලට ම ඇබ්බැහි වූ ජනයා අතරින් කිඳී ගිය දහයෙන් කොටසට හැම කල්හි ම සිටියහ.

බුද්ධ කාලයෙහි සිට ම විශාල සොර මුළු සිටි බවට සාක්ෂ්‍ය ඇති පිටිසර පෙදෙස්වල අපරාධ තදින් පැතිර පැවැතුණේ ය. පරම්පරාවෙන් ම සොරුන් වූ, පසු කාලවල සොරුන් මෙන් කොල්ලකෑමෙහි යෙදී සියතට අසු වූවන් මරා දැමීම ආගමික කටයුත්තක් ලෙස කළා වූ සොර කණ්ඩායම් ගැන මුල් ම වාර්තා හියු එං සාං සපයයි. වෙළඳ ගැල් සමූහ බලවත් ලෙස ආරක්ෂා කරන ලද නමුත් මං පහරන සොරුන් වරින් වර ඒවා කොල්ල කෑවෝ ය. ඉතා ශූර පෞරාණික ඉන්දියානු නරවරයන් ඒවා මර්දනය කිරීමට වග බලාගත් බව විදේශ සංචාරකයන් බොහෝ දෙනකුන්ගේ සාක්ෂ්‍යවලින් පෙන්නුම් කරතත්, මෙසේ පෞරාණික ඉන්දියාව බරපතළ අපරාධ පිළිබඳ බැරෑරුම් ප්‍රශ්නයට නිතර මුහුණ පා සිටියා ය. රාජපුරුෂයන් හා යුද්ධභට හමුදාවන්ගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩල ඇති ව සිටි ප්‍රදේශීය නිලධාරීන්ගේ හා හමුදාවල අණ දෙන නිලධාරීන්ගේ මාර්ගයෙන් ද එසේ ම අපරාධ පරීක්ෂක රහස් පොලිස් නිලධාරීන්ගේ මාර්ගයෙන් ද අපරාධ මැඩ පවත්වන ලදි. නගරයේ හා ගමේ ද මුරකරුවෝ රෑ මුළුල්ලෙහි ආරක්ෂාවෙහි යෙදී සිටියෝ ය.

පැරැණි ධර්ම සූත්‍රයන්හි සඳහන් වන කුඩා රාජ්‍යවල රජතුමා යුක්තිය පිළිබඳ එක ම ප්‍රභවස්ථානය වන්නට ඇත. යෂ්ටියෙන් තෙමේ ම වරදකරුවන් හැටියට ඔප්පු වන සොරුන්ට පහර දී මරා දමන්නට ද ඇත. එහෙත් සාමාන්‍යයෙන් නඩු විසඳීම රජු වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයන්ට පැවරී තිබුණේ ය. රාජසභාව ඇපැල් නඩු ඇසීමට හා රාජ්‍යයට විරුද්ධ ව කරනු ලබන බරපතළ ද්‍රෝහී ක්‍රියාවන් පිළිබඳ නඩු විසඳීමටත් වෙන් ව තිබිණ.

උසාවිය සෑදී තිබුණු අයුරු කලින් කලටත් තැනින් තැනටත් අනුව වෙනස් විය. එහෙත් පුරාණ ඉන්දියාව තනි නඩුකාරයකුට වඩා නඩුකාරවරුන් කීපදෙනකුන්ගෙන් සෑදි විනිශ්චයාසනයකට කැමැත්තක් දැක්වූ බව සාක්ෂිවලින් පෙනේ. විනිශ්චයකාරයන් පස්දෙනකුන් ඉඳගත් අවස්ථාවක් ගැන ජාතක කථාවක සඳහන් වෙයි. මොවුන් පස් දෙන ම දූෂිත අය වීම වූ කලී අද්භූත සිද්ධියකි. සෑම ගම් දහයකට ම මහේස්ත්‍රාත්වරුන් තිදෙනා බැගින් ඉඳගන්නා විනිශ්චයාසනයක් ද දිස්ත්‍රික්කවලට හා පළාත්වලට වඩා ඉහළ උසාවියක් ද තිබිය යුතු යැයි අර්ථශාස්ත්‍රය අනුශාසනය කරයි. ප්‍රාඩ්විවාකයකු හා තවත් අප්‍රධාන විනිශ්චයකාරවරුන් තිදෙනකුන් ඉඳගන්නා විනිශ්චයාසනයක් මනු යෝජනා කරයි.

නඩු විසඳීමෙහි දී ඇති වූ අක්‍රමිකතා ගැන සඳහන් වන තැන් නිතර ඇතත්, විනිශ්චයකාරවරුන්ට දී තිබුණු වගකීම ඉතා උසස් ය. ඔවුහු උගත්තු විය යුතු වූහ. ආගම භක්තියෙන් යුතු අය විය යුත්තෝ ය. කෝපයෙන් තොර විය යුත්තෝ ය. මනුෂ්‍යයන් හැටියට හැකි ඉහළ ම ප්‍රමාණයෙන් අගති විරහිත අය විය යුතු ය. නඩුවක් අසා තීන්දු කරන තෙක් විනිශ්චයකාරයන් හා නඩු කියා ගන්නවුන් අතරෙහි පෞද්ගලික ව මුණ ගැසීමට ඉඩ නොතැබිය යුතු යැයි අල්ලස් දීම වැළැක්වීම සඳහා යෝජනා කොට ඇත. විනිශ්චයකාරවරුන්ගේ අවංකභාවය ඔවුන් වරදට පොලඹවනසුලු රජුගේ නියෝජිතයන්ගේ මාර්ගයෙන් වරින් වර පරීක්ෂා කළ යුතු යැයි අර්ථශාස්ත්‍රය දක්වයි. නඩු විසඳීමේ දී දූෂණ ක්‍රියා කිරීම හා අසාධාරණ ලෙස කටයුතු කිරීමට දඬුවම් නම් එවැන්නක් කොට අසු වුව හොත් ඒ විනිශ්චයකාරයා රටින් පිටුවහල් කිරීම හා ඔහු සතු සියලු වස්තුව රාජසන්තක කිරීම යයි විෂ්ණුස්මෘතිය නියම කරයි. මෙය ධර්ම නීතිය යටතේ බමුණෙකුට නියම කළ හැකි ඉතා බරපතළ ම දඬුවම යි.

බොරු සාක්කිකරුවා සාමාන්‍යයෙන් ම මහත් පිළිකුලකින් සලකන ලදි. ඔහුට ලෞකික වශයෙන් ලැබෙන නොයෙක් දඬුවම් හැර මරණින් මත්තෙහි සියවරක් අපායේ ඉපදීම ද දඬුවම් වෙයි. බරපතළ අපරාධවල දී සෑම තැන්වලින් ම සාක්ෂ්‍ය පිළිගත හැකි ව තිබිණ. එහෙත් සිවිල් නඩුවල දී ඇතැම් අය පමණක් සාක්ෂ්‍ය දීමට නිස්සෝ වූහ. ස්ත්‍රීන්, උගත් බමුණන්, රාජ සේවකයන්, අඩු වයස් ඇත්තන්, ණයගැතියන්, අපරාධ වාර්තා ඇත්තන්, ශාරීරික විකෘතිවලින් පීඩා විඳින්නවුන් යන මේ හැම සාක්ෂි දීමට නොකැඳවිය හැකි අය යි. එසේ ම වංශවතුන්ට විරුද්ධව කුලහීනයන් දුන් සාක්ෂි ද වළංගු නොවී ය. සාක්ෂ්‍යවල සත්‍යතාව මැන බැලීමට නොයෙක් පරීක්ෂණ ක්‍රම පනවා ඇත. ඒවායින් සමහරක් මනෝවිද්‍යාව අතින් ඉතා හොඳ ඒවා ය. චූදිතයකු, ඉතා තදින් සැකයට භාජන ව සිටින විට ඔහු ලවා පාපෝච්චාරණය කරවීමට ශාරීරික වධ දිය හැකි විය. මේ සඳහා නියම කරනු ලබන සියලු ම හිංසා අන්ත දරුණු ඒවා ම නොවේ. එක් එක් තාලයේ කස පහර දීම මීට ඇතුළත් වෙයි. බ්‍රාහ්මණයෝ ද ළදරුවෝ ද වැඩිමහල්ලෝ ද ගිලනුන් ද පිස්සෝ ද එසේ ම ගර්භනී ස්ත්‍රීහු ද යන මෙකී අය සිද්ධාන්ත වශයෙන් වධ හිංසාවලින් නිදහස් වූවෝ ය. ස්ත්‍රීන්ට නියම කරන ලද්දේ සැහැල්ලු තාලයේ වධ හිංසා ය.

[ 7 වන පිටුව බලන්න.

වරදකරු ද නැද්ද යන්න නිශ්වය කිරීමේ තවත් ක්‍රමයක් නම් චූදිතයාට නිවරදකාරයා නම් මේ දේ කරව යි කියා ඉතා වේදනා ඇති කරන විදියේ දුෂ්කර වූ යම් යම් දේ කිරීමට නියම කිරීමයි. අපරාධ නඩු හා සිවිල් නඩු යන දෙකට ම මෙය භාවිත කළ හැකි විය. මේවා දැනටත් සමහර ආකාරවලින් උසාවියෙන් පිටත දී යම් යම් අයිතිවාසිකම් පැසිදීමට අන්තිම උපාය වශයෙන් පාවිච්චි කරනු ලැබේ. මුල් කාලවල මේ දිව්රීම් ක්‍රමය ගැන පත්පොත්වල වැඩියෙන් සඳහන් වී නැති නමුත් පසු කාලවල ඉතා තදින් ජනප්‍රිය ව ගොස් ඇති සේ පෙනේ. ස්මෘති ලේඛකයෝ මේ දිව්රීම් ක්‍රමය කැලම විශ්වාස නොකළෝ ය. සාමාන්‍යයෙන් ඔවුන් මේ ක්‍රමය යෙදුවේ දෙපක්ෂයේ ම තදබල ශක්තිමත් සාක්ෂ්‍ය නොමැති නඩුවල දී පමණි. ගින්නෙන් විසඳීම හා දියේ ගිල්වීම වැනි මධ්‍යතන යුගයේ යුරෝපයේ රටවල පැතිර පැවති ක්‍රමවලට සමාන වූ, දූරාතීතයේ ඉන්දු යුරෝපීයයන් අතරේ පොදුවේ ව්‍යවහාර වන්නට ඇති ක්‍රම ද ඇතුළත් මෙබඳු දිව්රීම් ක්‍රම ගණනක් ම දක්වා ඇත. නගුල් තලයෙන් කරන විසඳීම වෙසෙසින් ම විනෝදය උපදවනු සුලු ය. එය කරන විට චූදිතයාට රත් පැහැ වන තෙක් ගිනියම් කළ නගුල් තලයක් සිය දිවෙන් ස්පර්ශ කරන්නට සිදු වෙයි. ඔහුගේ දිව නොදැවුණි නම් හේ අහිංසකයකු ලෙස පිළිගනු ලැබිණ. ප්‍රතිඵලය ගැන ස්වකීය විශ්වාසය ඇති ව ම කරන්නට ඉදිරිපත් වන මෙය වූ කලි මානසික ව ද සාධාරණ විදියේ හොඳ පරීක්ෂණයකි. ඔහුට තමා වරදකාරයා ය යන්න හෘදය සාක්ෂ්‍යය කියා නම් ඔහුගේ කටෙහි කෙළ වගුරුවන පේශීහු නිසි ලෙස ක්‍රියාකාරී නො වෙති. එහෙයින් ඔහුගේ දිව පිළිස්සේ.

නීතිය හදාළ බ්‍රාහ්මණයන් බොහෝ ගණනක් සිටියත් ඔව්හු කවර කලෙකවත් එය ම වෘත්තිය කොට ගත් නීතිඥයන්ගේ පන්තියක් ලෙස සංස්ථාවක් නොපිහිටුවූහ. උසාවියේ දී විනිශ්වයකාරයන් හැටියට සේවය නො කළ නීතිඥයෝ ඇත්ත වශයෙන් ම ඔවුන්ගේ දැනුම උසාවියෙන් බැහැර වියවුල් සංසිඳුවීමට පාවිච්චි කළෝ ය. මෙය මෙසේ වන්නට ම ඇත. අප මේ සාකච්ඡා කරන කාලපරිච්ඡේදය අවසන, අප වර්තමානයේ ව්‍යවහාර කරන හැටියට, නීතිඥ පන්තියක් බිහි වන්නට පටන් ගත්හ යි පිළිගැනීමට සාක්ෂ්‍ය ඇත.

(i) අපරාධ හා සිවිල් වශයෙන් නඩු දෙවර්ගයක් පැවති බව මේ පාඨයෙන් හෙළි වේ. (.........)

(ii) සැකයට භාජනය වූ චූදිතයෙකු ලවා පාපෝච්චාරණය කරවීමට දුන් ශාරීරික හිංසා අන්ත දරුණු ඒවා විය. (.........)

(iii) පෞරාණික ඉන්දියාවේ අපරාධ මැඩ පැවැත්වීමට යොදාගත් නිලධාරීහු තෙවර්ගයක් වූහ. (.........)

(iv) නගරබද පළාත්වල අපරාධ තදින් පැතිර නොපැවතිණි. (.........)

(v) නගරයේ හා ගමේ මුරකරුවෝ ආයුධ සන්නද්ධ ව දිවා රෑ දෙකෙහි ම ආරක්ෂාවෙහි යෙදී සිටියහ. (.........)

(vi) පුරාණ ඉන්දියානු උසාවිවල විනිශ්වයාසනයේ තනි නඩුකාරයකුට වඩා නඩුකාරවරුන් කීප දෙනෙකු යෙදවීම අනිවාර්ය විය. (.........)

(vii) භාරත නීති සාහිත්‍යයේ පදනම තැනී ඇත්තේ දේපළ සම්බන්ධ ආරක්ෂා රහිත බවෙන් ඇති වන ගැඹුරු හැඟීම්වලිනි. (.........)

(viii) නීතිය වෘත්තිය කොට ගත් නීතිඥයන්ගේ සංස්ථාවක් පැරණි භාරතයේ නොවී ය. (.........)

(ix) චූදිතයා වැරදිකාරයා ද නැද්ද යන්න නිශ්වය කිරීමට යොදා ගත් උපක්‍රම දෙකක් මේ ලේඛකයා ඉදිරිපත් කරයි. (.........)

(x) නඩුවක් අසා තීන්දු කිරීමෙන් පසු නඩුකාරයන් හා නඩු කියන්නන් පෞද්ගලික ව මුණ ගැසීමට බාධාවක් නොවී ය. (.........)

(xi) සිවිල් නඩුවල දී සාක්ෂ්‍ය දීමට අයෝග්‍ය පුද්ගලයන් සත් වර්ගයක් ගැන තොරතුරු මේ පාඨයෙහි සඳහන් වේ. (.........)

(xii) වධහිංසා කිරීම්වලින් නිදහස් වූ කණ්ඩායම් පහකි. (.........)

(xiii) ශාරීරික වේදනා ඇති කරන විදියේ දුෂ්කර වූ යම් යම් දේ කරවීම මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නකි. (.........)

(xiv) පැරණි භාරතයේ බොරු සාක්ෂිකාරයන් ද සිටි බව මේ පාඨයෙන් ගම්‍යමාන වේ. (.........)

(xv) කස පහර දීම දරුණු දඬුවමක් නොවන බව මේ ලේඛකයාගේ පිළිගැනීමයි. (.........)

(xvi) නීතිය හැදෑරීම බ්‍රාහ්මණයන්ට පමණක් අයත් කාර්යයක් වීය. (.........)

(xvii) හියු එං සාං වාර්තාවල සඳහන් වන්නේ සොරුන් මරා දැමීමෙහි යෙදුණු සොර කණ්ඩායම් සිටි බව යි. (.........)

(xviii) නඩු විසඳීම සාමාන්‍යයෙන් කරන ලද්දේ රජතුමා විසින් පමණකි. (.........)

(xix) රාජසභාව විසින් විසඳිය යුතු නඩු දෙවර්ගයක් විය. (.........)

(xx) නඩුකාරවරුන් සතුව පැවතිය යුතු ලක්ෂණ හතරක් මේ පාඨයෙහි දැක්වේ. (.........)

[ 8 වන පිටුව බලන්න.

37. පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාවෙන් **තුනෙන් එකක්** පමණ වන සේ සාරාංශ කොට ලියා, යෝග්‍ය **මාතෘකාවක්** ද යොදන්න. ඔබ ලියූ **වචන සංඛ්‍යාව** සාරාංශය අවසානයේ සඳහන් කරන්න. *(ලකුණු 15 යි)*

පසුගිය වසර කිහිපය තුළ දී, මෝසම් කාලගුණික තත්ත්ව මගින් ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොලැබුණු අතර, වර්ෂාපතනය ඉතා කෙටි කාලයක් තුළ කේන්ද්‍රගත වීම හේතුවෙන් රට පුරා දැඩි නියං මෙන් ම, ගංවතුර හා නායයෑම් තත්ත්ව ද ඇති විය. අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් සිදු වූ මෙම වෙනස්වීම් ආහාර මිල ගණන් හා නිෂ්පාදනය, පානීය ජල සැපයුම, වාරිමාර්ග කටයුතු හා ජලවිදුලි උත්පාදනය සඳහා බෙහෙවින් බලපෑම් සිදු කොට ඇත. එබැවින්, දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා මැදිකාල හා දීර්ඝකාලීන දැක්මකින් යුතු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කල් ඇති ව ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. කෘෂිකාර්මික අංශයෙහි ජල භාවිතයෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවිය යුතු අතර, නියඟයට ඔරොත්තු දෙන හා ඉහළ අස්වැන්නක් ලබා දෙන වී ප්‍රභේද ප්‍රවර්ධනය කළ යුතු ය. කෘෂිකාර්මික ප්‍රජාව අතර අවදානම වෙනත් පාර්ශ්වයකට පැවරීමේ ක්‍රමවේදයක් ලෙස කෘෂි භෝග රක්ෂණ ක්‍රමය ප්‍රවර්ධනය කළ හැකි ය. මීට අමතර ව, පුළුල් වශයෙන් ස්ථාවර මිල ගණන් යටතේ රට පුරා ඒකාකාර වූ සැපයුම් තත්ත්වයක් පවත්වා ගැනීම සඳහා ප්‍රධාන ධාන්‍ය වර්ග සඳහා ආරක්ෂණ තොග පවත්වා ගැනීම අවශ්‍ය වේ. තව ද, ප්‍රධාන විදුලිබල සැපයුම මත රඳා පැවැතීම අඩු කිරීම සඳහා සූර්ය බල ශක්තිය වැනි සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කිරීම සඳහා දිරි ගැන්වීම ලබා දීම ද අවශ්‍ය වේ. පුද්ගල ජීවනෝපාය සඳහා කාලගුණික බාධාවලින් සිදු වන බලපෑම අවම කිරීම සඳහා ප්‍රදේශීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ගේ සහ අන්තර්ජාතික සංවර්ධන නියෝජිත ආයතනවල සහභාගිත්වය ඇතිව, ආපදා අධීක්ෂණ හා කළමනාකරණ යාන්ත්‍රණය ශක්තිමත් කළ යුතු ව ඇත. (වචන සංඛ්‍යාව 216)

**මාතෘකාව** : ..........................................................................................

..................................................................................................................................

**වචන ගණන :** ...............................................

38. පහත දැක්වෙන විස්තරය කියවා එහි අන්තර්ගතයට අදාළ වන සේ නිර්දිෂ්ට මග පෙන්වීම යටතේ විශ්ලේෂණාත්මක හා විචාරාත්මක රචනයක් ලියන්න. වචන සංඛ්‍යාව **250 - 300** අතර විය යුතු ය. රචනයට ගැළපෙන **මාතෘකාවක්** ද යොදන්න. *(ලකුණු 25 යි)*

බෝවන රෝග ව්‍යාප්තිය හේතුවෙන් වර්තමාන ලෝක සෞඛ්‍ය ක්ෂේත්‍රය අභියෝග රැසකට මුහුණ පා ඇත. මේ අභියෝග ජය ගෙන ලෝක ප්‍රජාව සුඛිත මුදිත කිරීමට අවශ්‍ය පිළියම් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික අංශයේ ද දායකත්වය ලැබිය යුතු ය.

- බෝවන රෝග ලෝකය පුරා පැතිර යාම
- මේ නිසා ලෝක සෞඛ්‍ය ක්ෂේත්‍රය මුහුණ පාන අභියෝග
- අභියෝග ජය ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල දායකත්වය
- මේ අභියෝග ජය ගැනීමට ගත හැකි උපාය මාර්ග
- වර්තමාන සෞඛ්‍ය පර්යේෂණවල ප්‍රතිඵල

ඔබේ අදහස සමර්ථනය කිරීමට නිශ්චිත හේතු සහ නිදර්ශන සපයන්න.

(මේ සඳහා අන්තර්ගතය, භාෂාව, වාක් කෝෂය හා ආකෘතිය / සැලැස්ම / සංවිධානය හා සමාලෝචනය / නිගමනය යන අංශ යටතේ ලකුණු පිරිනැමේ. නියමිත වචන සංඛ්‍යාවට වඩා **වචන 25ක් අඩුවෙන් හෝ වැඩියෙන් හෝ** ලියා ඇති රචනාවලට ලකුණු අඩු **කෙරේ.)**

**මාතෘකාව** : ..................................................................................................................

..................................................................................................................................

[ 10 වන පිටුව බලන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගය - 2021

## (02) සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය


පැ දෙකයි

## I කොටස - සාමාන්‍ය දැනීම

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ.

**0 1 2 3 4 5 6 7 8 9**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

....................................

විභාග අංකය නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....................................

වැදගත් :

- ✳ විෂය අංක **(02)** සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය ප්‍රශ්න පත්‍රය, **I** කොටස - සාමාන්‍ය දැනීම හා **II** කොටස - සාමාන්‍ය බුද්ධිය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.
- ✳ එම කොටස් දෙකට ම නියමිත කාලය පැය දෙකකි.
- ✳ මෙම **I** කොටස - සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය පිටු **6** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.
- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- ✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**
- ✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.
- ✳ **I** කොටස හා **II** කොටස සඳහා වන පිළිතුරු පත්‍ර වෙන වෙනම භාරදෙන්න.
- ✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල් හෝ කළු** හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි **නොකරන්න.**
- ✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම, ඡායාරූප ගැනීම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
- ✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

### පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 8 | |
| 3 | 9 - 16 | |
| 4 | 17 - 26 | |
| 5 | 27 - 39 | |
| 6 | 40 - 50 | |
| එකතුව | | |

### අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | | |
|---|---|---|
| උත්තර පත්‍රය | ලකුණු කළේ | |
| | පරීක්ෂා කළේ | |
| | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

[ 2 වැනි පිටුව බලන්න.

● අංක **1** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර ඇතුළත් වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

**1.** 2019 ශ්‍රී ලංකා මහ බැංකු වර්තාව පෙන්වා දෙන ආකාරයට, 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති විරැකියා අනුපාතය,
   (1) පෙර වසරෙහි පැවති 4.4% සිට 4.8%ක් දක්වා වැඩි විය.
   (2) පෙර වසරෙහි පැවති 5.8% සිට 5.2%ක් දක්වා අඩු විය.
   (3) පෙර වසරෙහි පැවති 6.3% සිට 7.2%ක් දක්වා වැඩි විය.
   (4) පෙර වසරෙහි පැවති 8.2% සිට 7.3%ක් දක්වා අඩු විය. (………)

**2.** 2019 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ ණය ප්‍රමාණය එහි දළ දේශීය නිෂ්පාදනයට (GDP) සාපේක්ෂ ව කවර අනුපාතිකයක් ව පැවතියේ ද?
   (1) 40.2% (2) 59.3% (3) 66.6% (4) 72.1% (………)

**3.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැඩි ම මරණ සංඛ්‍යාවක් සිදු වීමට හේතු වන කාරණය ලෙස සැලකෙන්නේ පහත සඳහන් කවරක් ද?
   (1) පිළිකා රෝග
   (2) රථවාහන අනතුරු
   (3) හෘදයාබාධ
   (4) සිය දිවි නසා ගැනීම් (………)

**4.** මෙරට අතීතයේ සිට ක්‍රියාත්මක වූ ‘රාජකාරි ක්‍රමය’ අවසන් කරනු ලැබුවේ කවර ප්‍රතිසංස්කරණ යෝජනා පදනම් කර ගෙන ද?
   (1) කෝල්බෲක් (2) මැකලම්
   (3) ඩොනමෝර් (4) සෝල්බරි (………)

**5.** වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 20 වැනි සංශෝධනය ගෙන එන තෙක් ශ්‍රේෂ්ඨාධිකරණය සමන්විත වූයේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ විනිශ්චයකාරවරුන් 6 සිට 10 දක්වා වන සංඛ්‍යාවකින් ය. 20 වැනි සංශෝධනය අනුව ශ්‍රේෂ්ඨාධිකරණය සමන්විත විය යුත්තේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ විනිශ්චයකාරවරුන් කොපමණ සංඛ්‍යාවකින් ද?
   (1) 5 සිට 15 දක්වා (2) 6 සිට 16 දක්වා
   (3) 8 සිට 17 දක්වා (4) 10 සිට 19 දක්වා (………)

**6.** ශ්‍රී ලංකාවේ පැරණි වැව් අතුරින් අනුරාධපුර යුගයට අයත් විශාලතම වැව කුමක් ද?
   (1) මින්නේරිය වැව (2) කලා වැව (3) යෝධ වැව (4) කන්තලේ වැව (………)

**7.** මෙරට දේශපාලන ඉතිහාසයේ වාර්තා වී ඇති එක ම ‘ජනමත විචාරණය’ 1982 වර්ෂයේ දී පැවැත්වුණි. ඒ පහත දැක්වෙන කවරක් සඳහා ජනතා මතය විමසීමට ද?
   (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට
   (2) පාර්ලිමේන්තුවේ කාලය දීර්ඝ කිරීමකට
   (3) ජනාධිපතිවරයාට එරෙහි දෝෂාභියෝගයකට
   (4) අග්‍රවිනිශ්චයකාරවරයා ඉවත් කිරීමට (………)

**8.** පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ,
   (1) ජනාධිපතිවරයා විසිනි.
   (2) අමාත්‍ය මණ්ඩලය විසිනි.
   (3) පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ බහුතර ඡන්දයෙනි.
   (4) පළාත් සභා මැතිවරණයක දී මහජන ඡන්දයෙනි. (………)

**9.** 'උදර්පණ නීති' ක්ෂේත්‍රය යටතේ ක්‍රියා කළ හැක්කේ පහත දැක්වෙන කවර කාරණයක් සම්බන්ධයෙන් ද?
(1) විදේශගත ව සැඟවී සිටින අපරාධකරුවකු නීතිය හමුවට පැමිණවීමට ගෙන්වා ගැනීම
(2) සේවා ස්ථානයක සිදුවන ලිංගික හිංසනයක්
(3) ඓතිහාසික නටබුන් ඇති ආගමික සිද්ධස්ථානයක නීති විරෝධී නිදන් හෑරීම
(4) වෙරළ ඛාදනය ඇති කරවන සේ මහා පරිමාණයෙන් මුහුදු වැලි ඉවත් කිරීම මගින් වෙරළාරක්ෂක නීති උල්ලංඝනය කිරීම (.........)

**10.** නීතිඥවරයකුගේ පරම රාජකාරිය ලෙස සැලකෙන්නේ, පහත දැක්වෙන ඒවා අතුරෙන් කවරක් ද?
(1) තම සේවාදායකයා කෙසේ හෝ නිදහස් කරවා ගැනීම
(2) අධිකරණයට සහාය වීම
(3) අධිකරණය තුළ නීතිය පිළිබඳ තම තර්කණ හැකියාව පෙන්වීම
(4) අපරාධකරු නීතියේ රැහැනට හසු කර දීම (.........)

**11.** ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ආදර්ශ පාඨය ලෙස ලතින් භාෂාවෙන් ලියැවුණු '*Fiat justitia*' යන්නෙහි සරල අදහස වන්නේ, පහත සඳහන් කවරක් ද?
(1) නීතිය සැමට ඉහළින් පවතී
(2) නීතිය යුක්තියේ ආරක්ෂකයා ය
(3) යුක්තිය ඉටු වනු පිණිස
(4) යුක්තියේ භාරය නීතිය ය (.........)

**12.** උසාවි පද්ධතිය තුළ 'පිස්කල්වරු (fiscals)' යනු වැදගත් කාර්යභාරයක් ඉටු කරන පිරිසකි. ඔවුන්ගේ ප්‍රධාන රාජකාරියක් වන්නේ,
(1) විනිශ්චයකාරවරයා ඉදිරියෙන් සිට ඔහු කියන දෙය විස්තර කොට හඬගා කීම ය.
(2) චූදිතයකු වැරදිකරු බවට ප්‍රකාශ කළ විට ඔහු සිරමැදිරියට ඇතුළු කිරීම ය.
(3) නඩුපොත් ආදිය ගෙනැවිත් දෙමින් විනිශ්චයකාරවරයාට සහාය වීම ය.
(4) විනිශ්චයකාරවරයාගේ නියෝග පරිදි දේපළ තහනමට ගැනීමට යාම ය. (.........)

**13.** ෆාම් (තෙල්) වගාව (කටුපොල් වගාව) මෙරට තුළ තහනම් කිරීමට රජය විසින් මෑත දී තීරණය කරන ලදී. එහිදී ෆාම් වගාවෙන් සිදු වන **බලවත් ම හානිය** ලෙස දක්වනු ලැබුවේ මින් කවරක් ද?
(1) තේ, රබර් වගාවන්ට මුහුණ දීමට ඇති තර්ජනය
(2) භූගත ජල සම්පත සිඳී යාමේ තර්ජනය
(3) අවම ශ්‍රමයක් පමණක් අවශ්‍ය වන නිසා ග්‍රාමීය රැකියා විරහිතභාවයට බරපතල හේතුවක් වීම
(4) ෆාම් තෙල් බහුල ව භාවිත කිරීමෙන් ජනතාවගේ සෞඛ්‍යයට බරපතල තර්ජනයක් එල්ල වීම (.........)

**14.** 1978 න් පසු මෙරට උපරිමාධිකරණයන්හි ප්‍රකාශයට පත් කරනු ලබන වැදගත් නඩු තීන්දු නිල වශයෙන් වාර්තා කරනු ලබන්නේ,
(1) නව නීති වාර්තාවන්හි ය.
(2) ගැසට් පත්‍රයන්හි ය.
(3) ශ්‍රී ලංකා නීති සංගමයේ වාර්ෂික සංග්‍රහයේ ය.
(4) ශ්‍රී ලංකා නීති වාර්තාවන්හි ය. (.........)

**15.** 'Das Kapital' නැමැති ලෝක පූජිත කෘතියේ කතුවරයා කවු ද?
(1) ෆියඩෝර් ඩොස්ටොව්ස්කි
(2) ලියොන් ට්‍රොට්ස්කි
(3) කාර්ල් මාක්ස්
(4) ව්ලැඩිමීර් ලෙනින් (.........)

**16.** 'කුලවැද්දුම නඩුවක (Adoption case)' දී කරනු ලබන කාර්යය මේ අතුරින් කවරක් ද?
(1) දරුකමට හදාවඩා ගැනීම සඳහා පවරන නඩුවක් විභාග කිරීම
(2) දික්කසාද වීමට ආසන්න අඹු සැමි යුවළක් සාමදාන කරවීමට වෑයම් කිරීම
(3) විවාහ පොරොන්දුවක් කඩ කළ කෙනෙකුට විරුද්ධව පවරන නඩුවක් විභාග කිරීම
(4) දරුවකු වෙනුවෙන් නඩත්තු ගෙවීම පැහැර හරින අයෙකු සම්බන්ධයෙන් නඩු විභාග කිරීම (.........)

**17.** ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන සාමාන්‍ය විවාහ නීතිය අනුව දික්කසාද තීන්දුවක් ඉල්ලා නඩුවක් පැවරිය හැකි පදනමක් **නොවන්නේ** පහත දැක්වෙන කවරක් ද?
(1) අනාචාරය
(2) විවාහයට පෙර පැවති සුව කළ නොහැකි ලිංගික බෙලහීනතාව
(3) අඹු සැමියන්ගේ අදහස් නොගැළපීම නිසා දෙදෙනාගේ කැමැත්තෙන් විවාහය විසුරුවා හැරීම
(4) ද්වේශ සහගත ලෙස අත්හැර යාම (………)

**18.** වර්ෂ 2024 ග්‍රීෂ්ම ඍතු ඔලිම්පික් ක්‍රීඩා පවත්වනු ලබන්නේ පහත දැක්වෙන කවර නගරයක ද?
(1) පැරිස් (2) ඇතැන්ස් (3) බීජිං (4) සියෝල් (………)

**19.** වෛද්‍යවරයකු විසින් අවශ්‍ය නිසි අවධානයෙන් යුතු ව ප්‍රතිකාර නොකිරීම නිසා රෝගියකු අන්ධ විය. එය හුදෙක් ම වෛද්‍යවරයාගේ වෛද්‍ය නොසැලකිලිමත්භාවය (Medical negligence) නිසා සිදු වූයේ යැයි නඩුවක් පැවරීමේ දී අදාළ වන නීති අංශය කුමක් ද?
(1) පරිපාලන නීතිය (2) දිලික්ත නීතිය
(3) ගිවිසුම් නීතිය (4) බුද්ධිමය දේපළ නීතිය (………)

**20.** මෙරට මූල්‍යායතනවල තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව පිණිස 'ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාර ක්‍රමය' හඳුන්වා දී එහි කටයුතු මෙහෙයවනු ලබන්නේ පහත දැක්වෙන කවර ආයතනයකින් ද?
(1) මුදල් අමාත්‍යාංශය (2) ජනාධිපති ලේකම් කාර්යාලය
(3) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (4) ශ්‍රී ලංකා මහ බැංකුව (………)

**21.** චීන සන්නිවේදන ඉදිකිරීම් සමාගම (China Communications Construction Company) මගින් මෙරට වැඩි ම ආයෝජනයක් කරමින් ඉදි කරනු ලැබූ/ලබන ව්‍යාපෘතිය පහත දැක්වෙන ඒවා අතුරෙන් කවරක් ද?
(1) හම්බන්තොට වරාය (2) දක්ෂිණ අධිවේගී මාර්ගය
(3) කොළඹ වරාය නගරය (4) මත්තල ගුවන් තොටුපළ

**22.** මෑත දී එක්සත් රාජධානියේ (UK) සිට එවන ලද බහාලුම් විශාල සංඛ්‍යාවක් ආපසු එරටට ම හරවා යැවුණි. ඒවා තුළ අන්තර්ගත ව තිබුණේ මොනවා ද?
(1) පාවිච්චි කරන ලද පරිගණක (2) කල් ඉකුත් වූ ආහාර ද්‍රව්‍ය
(3) මත්පැන් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය (4) අපද්‍රව්‍ය (………)

**23.** වර්තමානයේ මෙරට ක්‍රියාත්මක වන නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කරනු ලැබුවේ කවර රටක ආධාරයෙන් ද?
(1) ඉන්දියාව (2) චීනය (3) ජපානය (4) එක්සත් රාජධානිය (………)

**24.** ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ වර්තමාන සභාපති ධූරය හොබවන්නේ කවුරුන් විසින් ද?
(1) එස්. ආර්. ආටිගල මහතා (2) ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා
(3) මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා (4) ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා (………)

**25.** ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් ඇතත් ධීවර වරායක් (Fishery harbour) ගොඩනගා **නොමැත්තේ** පහත කවර ස්ථානයක ද?
(1) වාලච්චේන (2) කිරින්ද (3) මීගමුව (4) පානදුර (………)

**26.** මෙරට බිහි වූ ප්‍රථම සමූපකාර සමිතිය ලෙස වාර්තා වන්නේ පහත දැක්වෙන කවරක් ද?
(1) සඳලංකාව සමූපකාර සමිතිය
(2) දුම්බර මිටියාවත සමූපකාර සමිතිය
(3) හිඟුරක්ගොඩ සමූපකාර සමිතිය
(4) අම්බලන්ගොඩ-බලපිටිය සමූපකාර සමිතිය (………)

**27.** දේශීය වශයෙන් සම්පූර්ණයෙන් ම ශ්‍රී ලංකාව තුළ දී නිෂ්පාදනය කළ මුල් ම චිත්‍රපටය පහත දැක්වෙන කවරක් ද?
(1) ගම්පෙරළිය (2) රන්මුතුදූව (3) සත්සමුදුර (4) රේඛාව (………)

**28.** පහත සඳහන් අය අතුරෙන් 'රේමන් මැග්සේසේ (Ramon Magsaysay)' ජාත්‍යන්තර සම්මානයෙන් පිදුම් **නොලැබූ** ශ්‍රී ලාංකිකයා කවුරුන් ද?
(1) නන්දා මාලිනී (2) පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව
(3) මර්සලීන් ජයකොඩි පියතුමා (4) ගෙත්සි ශන්මුගම් (………)

**29.** දෙවැනි ලෝක සංග්‍රාමය අවසන් වීමෙන් පසු 1945 වර්ෂයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) පිහිටුවනු ලැබුවේ,
(1) බ්‍රෙටන් වුඩ්ස් සම්මේලනයෙනි. (2) ජිනීවා සම්මුතියෙනි.
(3) වෝසෝ ගිවිසුමෙනි. (4) එක්සත් ජාතීන්ගේ නිල ප්‍රකාශයකිනි. (………)

**30.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය **නොලබන** රටක් වන්නේ, මේ අතුරින් කවරක් ද?
(1) චීනය (2) ප්‍රංශය (3) ඉන්දියාව (4) රුසියාව (………)

● අංක **31** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති **තිත් ඉර මත** ලියන්න.

**31.** 'කෝවිඩ්-19' වෛරසයට එරෙහි ව ශ්‍රී ලංකාවේ **ප්‍රථමයෙන්** ලබා දෙන ලද එන්නත කවර නමකින් හැඳින්වේ ද?
……………………………………………………………………………………………

**32.** 'පාකින්සන්' රෝගය මනුෂ්‍ය ශරීරයේ කවර ඉන්ද්‍රිය පද්ධතියක් සමග බැඳේ ද?
……………………………………………………………………………………………

**33.** දැනට ඉදිවෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගයේ මහනුවර සම්බන්ධතා දිගුවේ ගමනාන්තය ලෙස මේ වන විට සැලසුම් කර ඇත්තේ කවර ස්ථානයක් ද?
……………………………………………………………………………………………

**34.** අමෙරිකා එක්සත් ජනපදයේ පැවති පසුගිය ජනාධිපතිවරණයේ දී අභිනවයෙන් පත් වූ උපජනාධිපතිවරයා/වරිය කවුරුන් ද?
……………………………………………………………………………………………

**35.** තෙස්තමේන්තු නඩුකර විභාග කිරීමට අධිකරණ බලය ඇත්තේ කවර අධිකරණයකට ද?
……………………………………………………………………………………………

**36.** වර්තමාන පාර්ලිමේන්තුවේ 'පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ (COPE)' සභාපති ධූරය හොබවනු ලබන්නේ කවුරුන් විසින් ද?
……………………………………………………………………………………………

**37.** කිසියම් ඉඩමක් දීර්ඝ කාලයක් තිස්සේ භුක්ති විඳීම හේතුවෙන් කෙනෙකුට කාලාවරෝධ අයිතියක් ලැබේ යැයි සාමාන්‍ය තත්ත්වය යටතේ හිමිකම් කියාපෑමට **අවම** වශයෙන් කොපමණ කාලයක් එකී දේපළ ඔහු විසින් නිරවුල් ව සහ අඛණ්ඩ ව භුක්ති විඳ තිබිය යුතු ද?
……………………………………………………………………………………………

**38.** බුදල් නඩුවක් පැවරීමේ අවශ්‍යතාව පැන නගින්නේ යම් පුද්ගලයකු මියයන අවස්ථාව වන විට ඔහු සතු ව **අවම** වශයෙන් කොපමණ වටිනාකමකින් යුත් නිශ්චල සහ චංචල දේපළ තිබුණේ නම් ද?
……………………………………………………………………………………………

**39.** බ්‍රිතාන්‍ය පාලනය ආරම්භ වීමෙන් පසු මෙරට බිහි කරන ලද පැරණිතම රජයේ දෙපාර්තමේන්තුව කුමක් ද?
……………………………………………………………………………………………

[ 6 වැනි පිටුව බලන්න.

**40.** වෛද්‍යවරුන් ස්වකීය වෘත්තියේ ආචාරධර්ම පිළිපදින බවට කරන දිවුරුම කවර නමකින් හැඳින්වේ ද?

..........................................................................................................................................

**41.** මධ්‍යම අධිවේගී මාර්ගය ඉදි කිරීමේ දී මෙරටට ආවේණික සහ වඳවීමේ තර්ජනයට භාජනය වී ඇති ගසක් විනාශ වේ යැයි ආන්දෝලනයක් ඇති විය. එම වඳවෙමින් පවතින ශාක වර්ගයේ විද්‍යාත්මක නාමය කුමක් ද?

..........................................................................................................................................

**42.** සිමෙන්ති, ගල්, වැලි සහ යකඩ යන ද්‍රව්‍යයන්ට අතිරේක ව කොන්ක්‍රීට් මිශ්‍රණයක් සඳහා අවශ්‍ය වන අනෙක් මූලිකාංගය කුමක් ද?

..........................................................................................................................................

**43.** ශ්‍රී ලංකා නීතිඥ සංගමයට පත් වූ නව සභාපතිවරයා කවුරුන් ද?

..........................................................................................................................................

**44.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ක්‍රිකට් පුහුණුකරු වශයෙන් කටයුතු කරන්නේ කවුරුන් ද?

..........................................................................................................................................

**45.** දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපාරයක් ආරම්භ කළ ස්වීඩන් ජාතික බාලිකාව කවුරුන් ද?

..........................................................................................................................................

**46.** අමෙරිකා එක්සත් ජනපදයේ නොබෝ දා පැවති ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළ ජෝ බයිඩන් නියෝජනය කළේ කවර දේශපාලන පක්ෂය ද?

..........................................................................................................................................

**47.** කොළඹ පාරිභෝගික මිල දර්ශකය සම්පාදනය කරනු ලබන්නේ කුමන දෙපාර්තමේන්තුව විසින් ද?

..........................................................................................................................................

**48.** අධිකරණයකින් අයැද සිටිය හැකි 'අපේක්ෂිත ඇප (Anticipatory Bail)' යන්නෙන් කුමක් අදහස් කෙරේ ද?

..........................................................................................................................................

**49.** වර්තමානයේ පවතින නීතිය ප්‍රකාර ව පළාත් පාලන මැතිවරණයක දී කිසියම් පළාත් පාලන ආයතනයක තිබිය යුතු අනිවාර්ය **අවම** කාන්තා නියෝජන ප්‍රතිශතය කොපමණ ද?

..........................................................................................................................................

**50.** 2020 වර්ෂයේ රසායන විද්‍යාව සම්බන්ධයෙන් දෙදෙනකුට නොබෙල් ත්‍යාගය පිරිනැමුණි. ඉන් එක් අයකු අමෙරිකානු ජාතික ජෙනිෆර් ඒ. ඩවුඩ්න (Jennifer A. Doudna) ය. ප්‍රංශ ජාතික අනෙක් සම ත්‍යාගලාභියාගේ නම කුමක් ද?

..........................................................................................................................................

❊ ❊

මෙම පිටුව ප්‍රශ්න පත්‍රයෙන් වෙන් කිරීම හෝ විභාග ශාලාවෙන් බැහැර ගෙන යාම සපුරා තහනම් වේ.

කටු වැඩ සඳහා පමණි

DOE

*සියලු ම හිමිකම් ඇවිරිණි]*
*முழுப் பதிப்புரிமையுடையது]*
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගය - 2021

**(02) සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය**


පැ දෙකයි

**II කොටස - සාමාන්‍ය බුද්ධිය**

**විභාග අපේක්ෂකයින්ට උපදෙස්**

ඉතා වැදගත් :

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



✳ **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ.**

**0 1 2 3 4 5 6 7 8 9**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන සහ පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.**

..................................

විභාග අංකය නිවැරදි බවට
නිරීක්ෂකගේ කෙටි අත්සන

..................................

වැදගත් :

✳ විෂය අංක **(02)** සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය ප්‍රශ්න පත්‍රය, **I** කොටස - සාමාන්‍ය දැනීම හා **II** කොටස - සාමාන්‍ය බුද්ධිය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

✳ **එම කොටස් දෙකට ම නියමිත කාලය පැය දෙකකි.**

✳ මෙම **II** කොටස - සාමාන්‍ය බුද්ධිය ප්‍රශ්න පත්‍රය පිටු **9** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

✳ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**

✳ **I** කොටසේ හා **II** කොටසේ පිළිතුරු පත්‍ර වෙන වෙනම ශාලාධිපතිවරයාට භාර දෙන්න.

✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල් හෝ කළු** හෝ **පෑනෙන් පමණක්** ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා රූප හෝ ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 8 | |
| 3 | 9 - 16 | |
| 4 | 17 - 25 | |
| 5 | 26 - 31 | |
| 6 | 32 - 37 | |
| 7 | 38 - 45 | |
| 8 | 46 - 48 | |
| 9 | 49 - 50 | |
| **එකතුව** | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | | |
|---|---|---|
| උත්තර පත්‍රය | ලකුණු කළේ | |
| | පරීක්ෂා කළේ | |
| | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

[ 2 වැනි පිටුව බලන්න.

- අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය ආරම්භයේ දී අන්තර් සම්බන්ධතා සහිත පද තුනක කට්ටලයක් දී ඇත. ඊට **සමාන සම්බන්ධතාවක්** ඇති වරණය පහත දී ඇති වරණ අතුරෙන් තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

**1.** බීජය : පැළය : ගස
(1) භ්‍රෑණය : ළමයා : වැඩිහිටියා (2) පුතා : පියා : සීයා
(3) අයිස් : ජලය : හුමාලය (4) අතීතය : වර්තමානය : අනාගතය (………)

**2.** හොඳ : නරක : විශිෂ්ට
(1) තෙත් : වියළි : සිසිල් (2) නියුට්‍රෝන : ඉලෙක්ට්‍රෝන : ප්‍රෝටෝන
(3) ඉහළ : පහළ : උස (4) ශක්තිමත් : දුර්වල : බලසම්පන්න (………)

**3.** මිල : සැපයුම : ඉල්ලුම
(1) වර්ෂාව : ගංවතුර : ජලය (2) ධාරිතාව : පරිමාව : අවකාශය
(3) කාර්යක්ෂමතාව : ඵලදායීතාව : නාස්තිය (4) වේගය : දුර : කාලය (………)

**4.** වෛද්‍යවරයා : රෝගියා : ප්‍රතිකාරය
(1) ගුරුවරයා : ශිෂ්‍යයා : විෂය නිර්දේශය (2) පාරිභෝගිකයා : ව්‍යාපාරිකයා : ගනුදෙනුව
(3) විනිශ්චයකරුවා : නීතිඥයා : විනිශ්චය (4) නායකයා : අනුගාමිකයා : මෙහෙයවීම
(………)

**5.** සන්නාලියා : රෙදි : ඇඳුම්
(1) වඩුවා : දැව : ලී බඩු (2) කරණවැමියා : කතුර : හිසකෙස්
(3) ගොවියා : භූමිය : අස්වැන්න (4) සංගීතඥයා : ගී පද : ගීතය
(………)

- අංක **6** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර ඇතුළත් වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

**6.** එක්තරා සංඛ්‍යාවක් 13න් බෙදූ විට ශේෂය 11 වේ. එම සංඛ්‍යාව 17න් බෙදූ විට ශේෂය 16 වේ. එම සංඛ්‍යාව විය හැක්කේ මේ අතුරින් කුමක් ද?
(1) 37 (2) 50 (3) 63 (4) 67 (………)

**7.** පැයට කිලෝමීටර 80ක වේගයෙන් ධාවනය වන ශීඝ්‍රගාමී දුම්රියක්, වේදිකාව මත සිටින මිනිසකු තත්පර 9ක දී පසු කරයි. දුම්රියේ දිග මීටර කීය ද?
(1) 120 (2) 160 (3) 200 (4) 240 (………)

**8.** එක්තරා දිනෙක පාසලක පළමු වැනි කාලච්ඡේදය අවසානයේ දී *A* පන්තියේ සිටි සිසුන් 10 දෙනකු *B* පන්තියට යාම නිසා පන්ති දෙකෙහි ශිෂ්‍ය සංඛ්‍යා සමාන විය. දෙවැනි කාලච්ඡේදය අවසානයේ දී *B* පන්තියේ සිටි සිසුන් 20 දෙනකු *A* පන්තියට ගිය විට, *A* පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව *B* පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් දෙගුණයක් විය. පළමු වැනි කාලච්ඡේදයේ දී *A* පන්තියේ සිසුහු කීදෙනෙක් සිටියෝ ද?
(1) 60 (2) 70 (3) 80 (4) 90 (………)

කටු වැඩ සඳහා

[ 3 වැනි පිටුව බලන්න.

**9.** කර්මාන්තශාලාවක යන්ත්‍ර දෙකක් ඇත. එකක් අලුත් ය, අනෙක පැරණි ය. අලුත් යන්ත්‍රයට එක්තරා කාර්යයක් පැය 30ක දී නිම කළ හැකි අතර පැරණි යන්ත්‍රය එම කාර්යය නිම කිරීමට පැය 60ක් ගනියි. එම කාර්යය කඩිනම් කිරීම සඳහා කර්මාන්තශාලා කළමනාකරු යන්ත්‍ර දෙකම එකවර ක්‍රියාත්මක කිරීම අරඹයි. පැය 10ක දී අවසන් කරනු ලබන්නේ එම කාර්යයෙන් කවර ප්‍රතිශතයක් ද?

(1) 40% (2) 50% (3) 55% (4) 60% (………)

**10.** ඕනෑම නිඛිල සංඛ්‍යා දෙකක් සඳහා ⊖ සංකේතය මගින් පළමු සංඛ්‍යාවෙන් දෙවන සංඛ්‍යාව අඩු කිරීමේ ක්‍රියාව ද ⊗ සංකේතය මගින් එම සංඛ්‍යා දෙකෙහි ගුණිතයෙහි දෙගුණය ගැනීමේ ක්‍රියාව ද නිරූපණය වේ.
ඒ අනුව $1 \ominus [(-2) \otimes 3]$ හි අගය කීය ද?

(1) –13 (2) –11 (3) 11 (4) 13 (………)

**11.** නිෂිකා උපදින විට ඇගේ පියාගේ වයස අවුරුදු 29 ක් වූ අතර ඇයට වඩා අවුරුදු තුනකින් වයසින් බාල ඇගේ සොහොයුරා උපදින විට ඇගේ මවගේ වයස අවුරුදු 31ක් විය. නිෂිකාගේ දෙමව්පියන්ගේ වයස් පරතරය අවුරුදු කීය ද?

(1) 0 (2) 1 (3) 2 (4) 3 (………)

**12.** පෙරේරා මහත්මිය වාර්ෂිකව 3.5%ක සුළු පොලියක් ගෙවන ඉතිරිකිරීමේ ගිණුමක රු. 500 000ක් තැන්පත් කළා ය. ඇයට රු. 35 000ක් පොලිය ලෙස ලැබීමට අවුරුදු කීයක් ගත වේ ද?

(1) 2 (2) 3 (3) 4 (4) 5 (………)

**13.** උපාධි අධ්‍යයන වැඩසටහනකට අයත් ශිෂ්‍ය කණ්ඩායමක, තුනෙන් එකක් වයස අවුරුදු 19 ට අඩු වන අතර වයස අවුරුදු 19 ට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව, වයස අවුරුදු 19ක් වූ 50 දෙනෙකුගෙන් යුත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 20%කි. කණ්ඩායමේ මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව කීය ද?

(1) 80 (2) 90 (3) 100 (4) 120 (………)

**14.** සහෝදර සහෝදරියන් 9 දෙනෙකුගෙන් යුත් පවුලක වැඩිමලාගේ වයස අවුරුදු 28ක් ද බාලයාගේ වයස අවුරුදු 3ක් ද වේ. අනෙක් ළමයින් 7 දෙනාගේ මධ්‍යක වයස, සහෝදර සහෝදරියන් සියල්ලන්ගේ ම මධ්‍යක වයසට වඩා අවුරුද්දකින් අඩු වේ. සහෝදර සහෝදරියන් 9 දෙනාගේ මධ්‍යක වයස අවුරුදු කීය ද?

(1) 9 (2) 11 (3) 12 (4) 14 (………)

**15.** මහ මැතිවරණයක දී එක් ඡන්ද කොට්ඨාසයක $W, X, Y$ සහ $Z$ යන පක්ෂ හතර පිළිවෙළින් 8 : 6 : 3 : 1 අනුපාතයට ඡන්ද ලැබූහ. $X$ පක්ෂය $Z$ පක්ෂයට වඩා ඡන්ද 20 000ක් වැඩියෙන් ලැබුවේ නම්, $W$ පක්ෂය ලැබූ ඡන්ද සංඛ්‍යාව කීය ද?

(1) 24 000 (2) 28 000 (3) 30 000 (4) 32 000 (………)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ කිසියම් ප්‍රකාශයක් හා **I** සහ **II** යනුවෙන් ප්‍රමාණ දෙකක් බැගින් දී ඇත. දී ඇති ප්‍රකාශය ඇසුරෙන් එම ප්‍රමාණ දෙක සසඳා,

  **I** හි දැක්වෙන ප්‍රමාණය **II** හි දැක්වෙන ප්‍රමාණයට වඩා විශාල නම් $A$ ද,
  **II** හි දැක්වෙන ප්‍රමාණය **I** හි දැක්වෙන ප්‍රමාණයට වඩා විශාල නම් $B$ ද,
  **I** හි හා **II** හි දැක්වෙන ප්‍රමාණ සමාන නම් $C$ ද,
  වඩා විශාල ප්‍රමාණය තීරණය කළ නොහැකි නම් $D$ ද

  ප්‍රශ්නය ඉදිරියේ, දී ඇති **තිත් ඉර මත** ලියන්න.

**16.** හසන් පැයට කිලෝමීටර 5ක නියත ශීඝ්‍රතාවෙන් ගමන් කරයි

**I** – හසන් මිනිත්තු 80ක දී ගමන් කරන දුර

**II** – කිලෝමීටර 6.5

(………)

කටු වැඩ සඳහා

**17.** පසුගිය මාසයේ දී කුටුම්බයක මාසික විදුලි පරිභෝජනය ඒකක 160ක් විය. මෙම මාසයේ දී එය 15%කින් වැඩි වේ.

**I** – මෙම මාසයේ මාසික විදුලි පරිභෝජනය ඒකක

**II** – 184

(………)

**18.** එක්තරා පුස්තකාලයක ඇති ප්‍රබන්ධ කතා පොත් සංඛ්‍යාවත් ප්‍රබන්ධ නොවන කතා පොත් සංඛ්‍යාවත් අතර අනුපාතය 6 : 5 වේ. පුස්තකාලයෙහි එම ප්‍රබන්ධ කතා පොත් සංඛ්‍යාවෙහිත් ප්‍රබන්ධ නොවන කතා පොත් සංඛ්‍යාවෙහිත් එකතුව 5 500කි.

**I** – ප්‍රබන්ධ කතා පොත් සංඛ්‍යාව

**II** – 2 500

(………)

**19.** $x$, $y$ මෙන් දෙගුණයකි. $z$, $x$ වලින් තුනෙන් එකකි. $x + y + z = 77$ වේ.

**I** – $z$

**II** – 14

(………)

**20.** $n$ යනු $4n > 45$ සහ $3n < 42$ තෘප්ත කරන නිඛිලයකි.

**I** – $n$

**II** – 12

(………)

- අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි අක්ෂර/සංඛ්‍යා කිසියම් රටාවක් අනුව පිහිටා ඇත. එම රටා නිරීක්ෂණය කිරීමෙන් රටාවේ **?** සලකුණ මගින් දක්වා ඇති හිස්තැන සම්පූර්ණ කිරීම සඳහා වඩාත් ගැළපෙන වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

**21.** JQR, KST, LUV, …**?** …, NYZ

(1) MWX (2) MUW (3) MVW (4) MNX (………)

**22.** $C_3OVID$, $CO_5VID$, ……**?** ……, $COVI_9D$, $COVID_{11}$

(1) $CO_7VID$ (2) $COV_6ID$ (3) $COV_7ID$ (4) $COV_8ID$ (………)

**23.** DYEZF, GYHZI, ……**?** ……, MYNZO, PYQZR, SYTZU

(1) IYJZK (2) JKYZL (3) JYKLZ (4) JYKZL (………)

**24.** Q9PO, ……**?** …, K7JI, H6GF, E5DC

(1) N8ML (2) N8LM (3) M8NL (4) NM8L (………)

**25.** $Z_2U$, $YV_4$, $X_6W$, $WX_8$, $V_{10}Y$, …**?** …

(1) $UZ_{12}$ (2) $UZ_{11}$ (3) $U_{12}Z$ (4) $VZ_{12}$ (………)

කටු වැඩ සඳහා

**විභාග අංකය** :……………………

● අංක **26** සිට **30** තෙක් ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

දී ඇති කොටු දැලෙහි පේළි සහ තීර අතර කුඩා කොටු $3 \times 3$ මගින් සැදුනු 'සමචතුරස්‍ර' 9ක් ඇත. කොටු දැලෙහි සෑම පේළියක්ම, තීරයක්ම සහ සමචතුරස්‍රයක්ම 1 සිට 9 තෙක් ඉලක්කම්වලින් සම්පූර්ණ කළ යුතු වේ. එක් එක් පේළියෙහි, තීරයෙහි සහ සමචතුරස්‍රයෙහි එක් එක් ඉලක්කම තිබිය හැක්කේ එක් වරක් පමණි.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | | | 6 | | 9 | 8 | | |
| | | 5 | *C* | | 3 | | 6 | |
| *A* | | 8 | 4 | | 2 | | 1 | |
| | | | | 1 | | 3 | 8 | |
| 5 | | | | 2 | *D* | | | 7 |
| | 8 | 2 | | 6 | | | | |
| | 6 | | 5 | | 1 | 4 | *E* | |
| | 7 | | 2 | | | 5 | | |
| | *B* | 9 | 8 | | 7 | | | 6 |

ඉහත තොරතුරු අනුව එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරා එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

**26.** *A* නිරූපණය කරන සංඛ්‍යාව කුමක් ද?
(1) 3 (2) 6 (3) 7 (4) 9 (………)

**27.** *B* නිරූපණය කරන සංඛ්‍යාව කුමක් ද?
(1) 2 (2) 3 (3) 4 (4) 5 (………)

**28.** *C* නිරූපණය කරන සංඛ්‍යාව කුමක් ද?
(1) 1 (2) 5 (3) 7 (4) 8 (………)

**29.** *D* නිරූපණය කරන සංඛ්‍යාව කුමක් ද?
(1) 4 (2) 7 (3) 8 (4) 9 (………)

**30.** *E* නිරූපණය කරන සංඛ්‍යාව කුමක් ද?
(1) 2 (2) 5 (3) 7 (4) 9 (………)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

*P, Q, R, S* හා *T* යනු කොළඹ පිහිටි රජයේ කාර්යාලයක ආයතන, විශ්‍රාම, මූල්‍ය, විගණන සහ තොරතුරු තාක්ෂණ යන ශාඛාවල එම අනුපිළිවෙළින් ම නොව, සේවය කරන සේවකයෝ පස්දෙනෙකි. ඔවුන් දැනට කොළඹට තදාසන්න ප්‍රදේශවල නැවතී සිටින අතර කාර්යාලයට පැමිණීම සඳහා ඔවුන්ගේ ප්‍රවාහන මාධ්‍ය වනුයේ මෝටර් රථය, වෑන් රථය, බස් රථය, දුම්රිය සහ මෝටර් සයිකලය වේ. එය ද එම අනුපිළිවෙළින් ම නොවේ. එක් එක් සේවකයකු පැමිණෙන්නේ එක් ප්‍රවාහන මාධ්‍යයකින් පමණි.

- ❋ ආයතන ශාඛාවේ සේවය කරන පුද්ගලයා පැමිණෙන්නේ මෝටර් සයිකලයෙන් නොවේ.
- ❋ තොරතුරු තාක්ෂණ ශාඛාවේ සේවය කරන පුද්ගලයා පැමිණෙන්නේ දුම්රියෙන් නොවේ.
- ❋ *R* පැමිණෙන්නේ මෝටර් සයිකලයෙනි.
- ❋ තොරතුරු තාක්ෂණ ශාඛාවේ සේවය කරන පුද්ගලයා *S* වේ.
- ❋ ආයතන ශාඛාවේ සේවය කරන පුද්ගලයා මෝටර් රථයෙන් පැමිණෙන අතර දුම්රියෙන් පැමිණෙන පුද්ගලයා විගණන ශාඛාවේ සේවය කරයි.
- ❋ මූල්‍ය ශාඛාවේ සේවය කරන *P* වෑන් රථයෙන් පැමිණෙයි.
- ❋ *T* සේවය කරන්නේ විගණන ශාඛාවේ නොවේ.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

**31.** *Q* හා *R* සේවය කරන්නේ පිළිවෙළින්,
(1) විගණන සහ විශ්‍රාම ශාඛාවල ය. (2) විශ්‍රාම සහ විගණන ශාඛාවල ය.
(3) විශ්‍රාම සහ ආයතන ශාඛාවල ය. (4) විගණන සහ ආයතන ශාඛාවල ය. (………)

**32.** *Q* සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) විශ්‍රාම ශාඛාවේ සේවය කරන *Q* දුම්රියෙන් සේවයට පැමිණෙයි.
(2) ආයතන ශාඛාවේ සේවය කරන *Q* දුම්රියෙන් සේවයට පැමිණෙයි.
(3) විගණන ශාඛාවේ සේවය කරන *Q* දුම්රියෙන් සේවයට පැමිණෙයි.
(4) විගණන ශාඛාවේ සේවය කරන *Q* බස් රථයෙන් සේවයට පැමිණෙයි. (………)

**33.** *T* සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ආයතන ශාඛාවේ සේවය කරන *T* දුම්රියෙන් සේවයට පැමිණෙයි.
(2) විශ්‍රාම ශාඛාවේ සේවය කරන *T* මෝටර් රථයෙන් සේවයට පැමිණෙයි.
(3) විගණන ශාඛාවේ සේවය කරන *T* මෝටර් රථයෙන් සේවයට පැමිණෙයි.
(4) ආයතන ශාඛාවේ සේවය කරන *T* මෝටර් රථයෙන් සේවයට පැමිණෙයි. (………)

**34.** *R* හා *T* පිළිවෙළින්,
(1) විශ්‍රාම සහ විගණන ශාඛාවල සේවය කරති.
(2) විශ්‍රාම සහ ආයතන ශාඛාවල සේවය කරති.
(3) ආයතන සහ විගණන ශාඛාවල සේවය කරති.
(4) විගණන සහ ආයතන ශාඛාවල සේවය කරති. (………)

**35.** නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) *Q* දුම්රියෙන් ද *T* බස් රථයෙන් ද සේවයට පැමිණෙති.
(2) *Q* මෝටර් රථයෙන් ද *T* දුම්රියෙන් ද සේවයට පැමිණෙති.
(3) *Q* දුම්රියෙන් ද *T* මෝටර් රථයෙන් ද සේවයට පැමිණෙති.
(4) *Q* බස් රථයෙන් ද *T* මෝටර් රථයෙන් ද සේවයට පැමිණෙති. (………)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.
- ⁕ එක ම පවුලේ සාමාජිකයන් වන *P, Q, R, S* හා *T* යන පස්දෙනා එම පිළිවෙළින් ම නොව පියා, මව, වැඩිමහල් පුතා, දුව සහ බාල පුතා යන අයගෙන් සමන්විත වේ.
- ⁕ *P, R* සහ දුව යන තිදෙනා කෝපිවලට වඩා තේ ප්‍රිය කරති.
- ⁕ *Q* සහ මව යන දෙදෙනා තේවලට වඩා කෝපි ප්‍රිය කරති.
- ⁕ බාල පුතා, *S* සහ *P* යන තිදෙනා අතුරෙන් දෙදෙනෙක් තේවලට වඩා කෝපි ප්‍රිය කරති.
- ⁕ වැඩිමහල් පුතා සහ *R* එක්ව ක්‍රිකට් තරග නැරඹීමට කැමති ය.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

**36.** වැඩිමහල් පුතා කවරෙක් ද?
(1) *P* (2) *Q* (3) *R* (4) *S* (………)

**37.** බාල පුතා කවරෙක් ද?
(1) *P* (2) *Q* (3) *R* (4) *S* (………)

**කටු වැඩ සඳහා**

**38.** මව කවරෙක් ද?
(1) *Q* (2) *R* (3) *S* (4) *T* (………)

**39.** පියා කවරෙක් ද?
(1) *Q* (2) *R* (3) *S* (4) *T* (………)

**40.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පියා කෝපිවලට වඩා තේ ප්‍රිය කරයි.
(2) වැඩිමහල් පුතා තේවලට වඩා කෝපි ප්‍රිය කරයි.
(3) පියා තේවලට වඩා කෝපි ප්‍රිය කරයි.
(4) බාල පුතා ක්‍රිකට් තරග නැරඹීමට කැමති ය. (………)

- අංක **41** සිට **45** තෙක් ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

අමල්, බිමල්, සිරිල් සහ දයාල් යනු ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ අයදුම්කරුවන් සිවුදෙනෙකි. ඔවුහු අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව සහ ඉතිහාසය යන එකම විෂය සංයෝජනයෙන් පෙනී සිට ඇත. ඔවුන් සිවුදෙනාම අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයය ද සමත්ව ඇත. ඔවුන්ගෙන් සෑම අයකුම ඉහත සඳහන් විෂයයන් හතර සඳහා A, B, C සහ S ශ්‍රේණි ලබා ඇත.

* අමල්ට ආර්ථික විද්‍යාව සඳහා A ශ්‍රේණියක් ද, සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සඳහා C ශ්‍රේණියක් ද ඇත.
* බිමල්ට ඉතිහාසය සඳහා A ශ්‍රේණියක් ද, සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සඳහා B ශ්‍රේණියක් ද ඇත..
* සිරිල්ට ඉතිහාසය සඳහා C ශ්‍රේණියක් ද, ආර්ථික විද්‍යාව සඳහා B ශ්‍රේණියක් ද ඇත.
* දයාල්ට ඉතිහාසය සඳහා S ශ්‍රේණියක් ඇත.
* එක් එක් අයදුම්කරුවකු A ශ්‍රේණි 1ක්, B ශ්‍රේණි 1ක්, C ශ්‍රේණි 1ක් සහ S ශ්‍රේණි 1ක් ලබා ඇත.
* සෑම විෂයයකම ප්‍රතිඵල දැක්වෙන්නේ A ශ්‍රේණි 1ක්, B ශ්‍රේණි 1ක්, C ශ්‍රේණි 1ක් සහ S ශ්‍රේණි 1ක් වශයෙනි.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

**41.** අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා A ශ්‍රේණිය ඇත්තේ කාහට ද?
(1) අමල් (2) බිමල් (3) සිරිල් (4) දයාල් (………)

**42.** භූගෝල විද්‍යාව සඳහා S ශ්‍රේණිය ඇත්තේ කාහට ද?
(1) අමල් (2) බිමල් (3) සිරිල් (4) දයාල් (………)

**43.** ආර්ථික විද්‍යාව සඳහා C ශ්‍රේණිය ඇත්තේ කාහට ද?
(1) අමල් (2) බිමල් (3) සිරිල් (4) දයාල් (………)

**44.** සිරිල් ලබා ඇත්තේ පහත දැක්වෙන ඒවා අතුරෙන් කවරක් ද?
(1) භූගෝල විද්‍යාව සඳහා A ශ්‍රේණිය (2) භූගෝල විද්‍යාව සඳහා B ශ්‍රේණිය
(3) ආර්ථික විද්‍යාව සඳහා C ශ්‍රේණිය (4) ආර්ථික විද්‍යාව සඳහා S ශ්‍රේණිය (………)


**45.** බිමල් ලබා ඇත්තේ පහත දැක්වෙන ඒවා අතුරෙන් කවරක් ද?
(1) භූගෝල විද්‍යාව සඳහා S ශ්‍රේණිය (2) භූගෝල විද්‍යාව සඳහා B ශ්‍රේණිය
(3) ආර්ථික විද්‍යාව සඳහා S ශ්‍රේණිය (4) ආර්ථික විද්‍යාව සඳහා B ශ්‍රේණිය (………)


කටු වැඩ සඳහා


[ 8 වැනි පිටුව බලන්න.


- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.


**46.** පහත දී ඇති රූපයේ දර්පණ ප්‍රතිබිම්බය දැක්වෙන වරණය කුමක් ද?




(1)



(2)



(3)



(4)


(.........)


**47.** පහත දී ඇති රූපයේ භ්‍රමණයක් දැක්වෙන වරණය කුමක් ද?




(1)



(2)



(3)



(4)


(.........)


**48.** පහත දී ඇති රූපයේ භ්‍රමණයක් දැක්වෙන වරණය කුමක් ද?




(1)



(2)



(3)


(4)

(.........)

**49.** පහත දී ඇති රූපයේ භ්‍රමණයක් දැක්වෙන වරණය කුමක් ද?







(1) (2) (3) (4)

(………)

**50.** දී ඇති පතරොම මගින් සෑදිය හැකි ඝනකය දැක්වෙන වරණය කුමක් ද?





(1) (2) (3) (4)

(………)

✻ ✻ ✻

මෙම පිටුව ප්‍රශ්න පත්‍රයෙන් වෙන් කිරීම හෝ විභාග ශාලාවෙන් බැහැර ගෙන යාම සපුරා තහනම් වේ.

කටු වැඩ සඳහා පමණි

DOE